මගේ අංකය - 010/10/03/01
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය,
හුරුළුවැව ව්‍යාපාරය,
ගලෙන්බිදුණුවැව,
2019.11.05

ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ
සියළුම සාමාජික මහත්ම මහත්මීන් වෙත.

## 2019 – දෙසැම්බර් මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව.

හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකාර ආර්.එම්.ඩබ්.කේ. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් **දෙසැම්බර්** මස 03 වන දින පෙ.ව 9.30 ට පමණ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදී.

පළමුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් පැමිණ සිටි සියලුම රාජ්‍ය නිලධාරින් හා ගොවි සංවිධාන නිලධාරින් පිළිගනිමින් රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

### සහභාගි වූ රාජ්‍ය නිලධාරින්

| | | |
|---|---|---|
| 01 | ආර්.එම්.ඩබ්.කේ.ඒකනායක මහතා | නේවාසික ව්‍යාපෘති කළමනාකරු |
| 02 | එච්.විජිත් කොඩිතුවක්කු මහතා | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු, ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය |
| 03 | ඩබ්ලිව්.එම්.පී.කේ. කුමාර මහතා | කෘෂිකර්ම සංවර්ධන නිලධාරී,ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ගලෙන්බිදුණුවැව |
| 04 | එස්.බී.එන්.සෙනෙවිරත්න මිය | තාක්ෂණ සහයක, කෘෂිකර්ම උපදේශන කාර්යාලය, ගලෙන්බිදුණුවැව |
| 05 | එස්.එම්.ජී.අත්තනායක මෙනෙවිය | තාක්ෂණ සහයක, කෘෂිකර්ම උපදේශන කාර්යාලය, ගලෙන්බිදුණුවැව |
| 06 | එස්.ඩී.තෙරේසා සමරකෝන් මිය | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර,ගොවි ජන සේවා මධ්‍යස්ථානය-යකල්ල |
| 07 | ටි.එම්.ඒ.උදයංගනී මිය | සංවර්ධන නිලධාරි, නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය, හුරුළුවැව |
| 08 | යූ.ජී.ඒ.එස්.ආරියරත්න මහතා | සංවර්ධන නිලධාරි, නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය, හුරුළුවැව |
| 09 | ඒ.ඩී.සිරිපාල මිය | සංවර්ධන නිලධාරි, නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය, |

| | | |
|---|---|---|
| | | හුරුළුවැව |
| 10 | ඩබ්.ඒ.ජී.කේ ප්‍රියදර්ශනි මිය | සංවර්ධන නිලධාරි ,නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය, හුරුළුවැව |
| 11 | ඩී.එම්.පී.පුෂ්ප කුමාර මයා | අභ්‍යාසලාභී උපාධිධාරී සංවර්ධන නිලධාරි ,නේවාසික ව්‍යාපෘති කළ.කාර්යාලය, හුරුළුවැව |
| 12 | කේ.පේමරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 13 | ජේ.එම්.එස්.පී.ජයසිංහ මහතා | වාරිමාර්ග ජලපාලක |
| 14 | එච්.එච් අබේරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 15 | ඩබ්.ජී.එන්.එම්.ප්‍රේමරත්න මහතා | වාරිමාර්ග ජලපාලක |
| 16 | ඩී.එම්.අබේපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 17 | එම්.තුෂාර ධර්මප්‍රිය | වාරිමාර්ග ජලපාලක |
| 18 | ඩබ්.එම්.වීරසිංහ මහතා | වාරිමාර්ග ජලපාලක |
| 19 | ඩී.එම්.නිමල්රත්න බංඩාර මහතා | වාරිමාර්ග ජලපාලක |
| 20 | ඒ.ධනපාල මහතා | වාරිමාර්ග ජලපාලක |
| 21 | කේ.ජී. ඩබ්.එම්. අබේරත්න | වාරිමාර්ග ජලපාලක |

## සහභාගි වූ ගොවි සංවිධාන නිලධාරින්

| | | |
|---|---|---|
| 01 | ආර්.එම්.ආර්.තිලකරත්න මහතා | සභාපති, ඩී 10 කොකාවැව ගොවි සංවිධානය |
| 02 | බී.ජයතිස්ස තෙන්නකෝන් මහතා | සභාපති,යාය 05 රංකෙත ගොවි සංවිධානය |
| 03 | ඩී.පී.ඒ.සේනාරත්න මහතා | සභාපති,මහසෙන් ගොවි සංවිධානය |
| 04 | එස්.සුදත් උදය කුමාර මහතා | උප සභාපති,මහසෙන් ගොවි සංවිධානය |
| 05 | එච්.ආර්.එම්.සරත්චන්ද්‍ර මහතා | ලේකම්, සමඟි ගොවි සංවිධානය |
| 06 | බී.එම් පියසේන මහතා | ලේකම්,පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානය |
| 07 | කේ.කරුණාරත්න මහතා | සභාපති, රණමයුර උල්පත්ගම ගොවි සංවිධානය |
| 08 | ජේ.කරුණාරත්න මහතා | භාණ්ඩාගාරික, රණමයුර උල්පත්ගම ගොවි සංවිධානය |
| 09 | පී.ජයවීර මහතා | ලේකම්,රංකෙත යාය 05 ගොවි සංවිධානය |
| 10 | එච්. ඩි.ආර්.කරුණාරත්න මහතා | ලේකම්,නිකවැව ඩී 05 ගොවි සංවිධානය |
| 11 | නිහල් ජයවීර රත්නායක මහතා | සභාපති, යාය 06 එකමුතු ගොවි සංවිධානය |
| 12 | කේ.ජයම්පති විජේරත්න මහතා | භාණ්ඩාගාරික, යාය 06 එකමුතු ගොවි සංවිධානය |
| 13 | එච්.එම්.එස්.සුනිල් ශාන්ත මහතා | සභාපති,යාය 05 ගොවි සංවිධානය |
| 14 | එන්.කේ.ජී.ජයතිලක මහතා | භාණ්ඩාගාරික, හුරුළුනිකවැව ඩී 06 ගොවි |

| | | |
|---|---|---|
| | | සංවිධානය |
| 15 | ආර්.ඒ.පී.කේ.රණවක මහතා | සභාපති,දුටුවැව ඩී12- 13 පැරකුම් ගොවි සංවිධානය |
| 16 | යු.බි.ජයසේන මහතා | ලේකම්, ගලෙන්බිදුණුවැව ගොවි සංවිධානය |
| 17 | පී.ජී.නිහාල් රාජරත්න මහතා | සභාපති,කිවුලේකඩ ගොවි සංවිධානය |
| 18 | ඒ.නිමල් දයානන්ද මහතා | භාණ්ඩාගාරික,කිවුලේකඩ ගොවි සංවිධානය |
| 19 | පී.ජී.විමලදාස මහතා | ලේකම්,කිවුලේකඩ ගොවි සංවිධානය |
| 20 | ටී.අනුර සමන් බංඩාර මහතා | භාණ්ඩාගාරික, ඒකාබද්ධ ගොවි සංවිධානය |
| 21 | ටී.ජී.විමලසේන මහතා | සභාපති ,හුරුළුනිකවැව ඩී 05 ගොවි සංවිධානය |
| 22 | එම්.කේ.ජී.විජේපාල මහතා | භාණ්ඩාගාරික, සමගි ගොවි සංවිධානය |
| 23 | එම්.වයි.ජී.සෝමපාල මහතා | සභාපති, නිකවැව ඩී 06 ගොවි සංවිධානය |
| 24 | ඒ.ඩබ්.අබේසිංහ මහතා | ලේකම්, නිකවැව ඩී 06 ගොවි සංවිධානය |
| 25 | එස්.බී.කරුණාතිලක මහතා | සභාපති,අලුත්දිවුල්වැව ගොවි සංවිධානය |
| 26 | එච්.එම්.කරුණාරත්න මහතා | සභාපති,පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානය |
| 27 | කේ.එම්.උදේනි බංඩාර ඉලංගසිංහ මහතා | සභාපති, ඩී 3,4 මරදන්කල්ල ගොවි සංවිධානය |
| 28 | ඩබ්.ජී.සුනිල් ධර්මසිංහ මහතා | සභාපති, ඩී 11 දුටුවැව ගොවි සංවිධානය |
| 29 | එච්.එම්.උපාලි ඒකනායක මහතා | සභාපති,උදාර ගොවි සංවිධානය |

**<u>පසුගිය කමිටු රැස්වීම් වාර්තාව.</u>**

පසුගිය කමිටුවේ රැස්වීම් වාර්තාව සමාලෝචනය කරන ලදී.

**<u>ලිපි ලැබීම්.</u>**

ලිපි ලැබි නැත.

**<u>ආයතන සංවර්ධන කටයුතු - සංවර්ධන නිලධාරි</u>** <u>ටි.එම්.ඒ.උදයංගනි මිය.</u>

<u>(පසුගිය මස ප්‍රගතිය)</u>

| කාරණය | ප්‍රගතිය |
|---|---|
| කාරක සභා රැස්වීම් පැවැත්වීම. | 10 |
| මහා සභා රැස්වීම් පැවැත්වීම. | 06 |
| මාසික මුදල් සාරාංශ වාර්තා සැකසීම. | 07 |
| නිළවරණ පැවැත්වීම | 02(එකමුතු/කිවුලේකඩ) |

**<u>ඉදිරි මාසයේදී පැවැත්වීමට අපේක්ෂිත ආයතන සංවර්ධන කටයුතු:-</u>**

| කාරණය | ඉලක්ක | වගකීම |
|---|---|---|
| කාරක සභා පැවැත්වීම | 20 | සංවර්ධන නිලධාරින් |

| | | |
|---|---|---|
| මාසික මුදල් සාරාංශ සැකසීම | 20 | සංවර්ධන නිලධාරීන් |

- ★ එදින ව්‍යාපාර කමිටුවට පැමිණි එකමුතු,කොකාවැව,මහසෙන් යන ගොවි සංවිධාන වල නව නිලධාරීන් හදුන්වා දීම සිදු කරන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය |
|---|---|
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | මාසික මුදල් සාරාංශ වාර්තා සැකසීම මාස 3 කට වඩා ඉක්ම යන ගොවි සංවිධාන ඇත්තම් එම සංවිධාන වලට සියලු ආයතන වල සහය ලබා නොදීමට කටයුතු කරන ලෙස ඉල්ලීමක් කරන ලදී. |
| යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති - එච්.එම්.එස්.සුනිල් ශාන්ත මහතා | මුදල් සාරාංශ වාර්තා නියමිත මාසයට ලබා නොදෙන ගොවි සංවිධාන සදහා හැකියා සහතික නිකුත් නොකරන ලෙස ඉල්ලීමක් කරන ලදී. |

ආයතන සංවර්ධන කටයුතු පිළිබද වැඩිදුරටත් පැහැදිලි කල නේවාසික ව්‍යාපෘති කළමනාකාර මහතා
පැල විසුරුම් තාක්ෂණය පිළිබද පුහුණුවක් ඉලක්ක කර ඇති බවත්,දෙසැම්බර් මස 15 දිනට පෙර ක්ෂේත්‍ර චාරිකාව යාමට නියමිත බවත් පැවසීය.

## <u>වාරිමාර්ග කටයුතු - වාරිමාර්ග ඉංජිනේරු විජිත් කොඩිතුවක්කු මහතා.</u>

| ජලාශය | උසින් අඩි | අක්කර අඩි |
|---|---|---|
| හුරුළුවැව | 16.85 | 24163 |
| කිවුලේකඩ වැව | 12 | 2950 |
| දිවුල්වැව | 19.6 | 4186 |

කන්න රැස්වීමේදි 2019/11/14 දින වපුරා අවසන් කල යුතු බව ප්‍රකාශ කල බවත් වැවට අක්කර අඩි 20000 ක් ලැබුණ විට ජලය නිකුත් කරන බව ප්‍රකාශ කල බවත් දැනට පවතින ජල මට්ටම අනුව මුළු ව්‍යාපාරයම වී වගාවට යාම පිළිබද ගැටලුවක් පවතින බවත් හුරුළු පෝෂිත ඇලේ දැනට වගාව ආරම්භ කර ඇති නිසා දින 2 ක් මහවැලියෙන් ජලය ලබා දෙන බවත් ප්‍රකාශ කරන ලදි.
ඉන් අනතුරුව 2019/20 මහ කන්නයේ වගා තොරතුරු පිළිබද ගොවි සංවිධාන මට්ටමින් සාකච්ජා කල අතර
මුළු ව්‍යාපාරය තුල වී වගා කිරීමට අක්කර අඩි 37000 ක ජල ප්‍රමාණයක් අවශ්‍ය වුවද දැනට භාවිතා කිරීමට පවතින්නේ අක්කර අඩි 22163 ක් බැවින් බිම් සැකසීමට හුරුළු වැවෙන් ජලය ලබා දිය නොහැකි බවද ප්‍රකාශ කරන ලදී.

පෙර අත්දැකීම් අනුව මේ වන විට වගාව සිදු කල ගොවීන්ට ස්තූතිය පුද කර සිටින බවත් දිවුල් වැවෙන් පහල පවතින ඩී 11,ඩී 12-13,කොකාවැව ආදි ගොවි සංවිධාන වලට දිවුල් වැවෙන් ජලය ලබා ගත හැකි බව උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති උපාලි මහතා පැවසීය.

<u>කෘෂි කර්ම කටයුතු- තාක්ෂණ සහයක, කෘෂිකර්ම උපදේශන කාර්යාලය, ගලෙන්බිදුණුවැව- එස්.එම්.ජී.අත්තනායක මෙනෙවිය</u>

කන්න තීන්දු වලට අනුව 2019/20 මහ කන්නය මේ වන විට සති 2 ක් ප්‍රමාද වී ඇති බවත් ඒ අනුව ගොවින් මින් ඉදිරියට වගා කටයුතු කරන්නේ නම් අනිවාර්යයෙන් මාස 3 වී වගාවට යා යුතු බවත් ප්‍රකාශ කරන ලදී.
2019 දෙසැම්බර් 10 වන විටදි වපුරා අවසන් කිරීම සුදුසු බවත් වී පොලොවට දැමීමට පෙර බීජ ප්‍රතිකාරකයක් යෙදීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

එමෙන්ම පීසීප් ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් හා පැරෂුට් තැටි ලබා දීමට සැලසුම් කර ඇති බවත්,ජනවාරී මාසය තුල සෝයා වගා කිරීමට සුදුසු බවත් බීජ වැඩ සටහනේදී, බීජ ගොවීන්ගෙන් රු.200/= ක මිලට ලබා ගැනීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කරන ලදි.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීම ගත කාලය |
|---|---|---|---|---|
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | සම්බා වි වගා නොකර නාඩු වී වගා කිරිම සුදුසු බවත් දෙසැ.20 දින වන විට හෝ වපුරා අවසන් කල යුතු බවත් වැසි දිය හසුරන ලද ගොවීන්ට අනුව ඉදිරියට තීන්දු ගත යුතු බවත් | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ගරු සභාපති - එම්.වයි.ජී.සෝමපාල මහතා | ඩී 06 ගොවි සංවිධානයේ FC 48 ඇලෙහි පැරෂුට් වගාව සිදු කිරීමට නියමිත බවත් ඒ සදහා කෘෂි උපදේශනය ලබා දෙන ලෙසත් ඉල්ලීම් කරන ලදී. | | | |
| ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික - ටී.අනුර සමන් බංඩාර මහතා | වර්ෂාව සමග දෙසැම්බර් 20 වන විට සියලු කුඹුරු වපුරා අවසන් කිරිම සුදුසු බවට අදහස් දක්වන ලදී. | | | |

| | | | | |
|---|---|---|---|---|
| රණමයුර උල්පත්ගම ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික - ජේ.කරුණාරත්න මහතා | සිංහල මාස ක්‍රමය අනුව වගා කර අවසන් කල යුතු දිනය දෙසැම්බර් 20 දක්වා යාම සුදුසු බවට උපාලි මහතා දැක්වූ අදහස නිවැරදි වන බවත් ඒ අනුව 2019/20 මහ කන්නයේ වපුරා අවසන් කල යුතු දිනය ලෙස 2019/12/20 දිනය සුදුසු බවට යෝජනා කරන ලදි. | | | |
| පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති - එච්.එම්.කරුණාරත්න මහතා | ඉහත සදහන් යෝජනාව ස්ථිර කරන ලදී. | | | |
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | 2019 දෙසැම්බර් 20 න් පසුව වගා කරන සියලු ගොවීන්ගේ කුඹුරු වල කුඹුරු බට කොන්ක්‍රීට් කරන ලෙස යෝජනා කරන ලදී. | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ගරු සභාපති - එම්.වයි.ජී.සෝමපාල මහතා | නීතිය නිසි පරිදි ක්‍රියාත්මක කල යුතු බව පවසමින් ඉහත සදහන් යෝජනාව ස්ථිර කරන ලදී. | | | |
| දුටුවැව ඩී12- 13 පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපති - ආර්.ඒ.පී.කේ.රණවක මහතා | ගොවීන්ට පොහොර ලබා දීමේදි ගොවි සංවිධාන නිර්දේශය සලකා බලන ලෙසට කෘ.ප.නි.ස වරුන් දැනුවත් කරන ලෙසත්, ඇලවේලි සුද්ද නොකරන ගොවීන්ට ගොවි සංවිධාන නිර්දේශය ලබා නොදෙන බවත් ,<br>දියවර නැයෝ වැඩ සටහන මගින් සකස් කරන ලද කෘෂි පාරවල් හරහා යොදා තිබු බට කැඩි ඇති බවත් ඒවා සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්,<br>පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් කළු අමුණ ලෙස අමුණක් සකස් කර ඇති බවත් එමගින් 13 යායේ 877,895 කුඹුරුවල අක්කර 3 ක් පමණ ජලයෙන් යට වන බවත් ඒ සදහා යම් ක්‍රියාමාර්ගයක් ගත යුතු බවත් ප්‍රකාශ | | | |

| | | | | |
|---|---|---|---|---|
| | කරන ලදී. | | | |
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | කළු අමුණ පිළිබද දිස්ත්‍රික් කමිටුවේ සාකච්ජා වූ බවත් එහිදි ප්‍රාදේශීය ලේකම්තුමා ප්‍රශ්නයක් නොමැති බව ප්‍රකාශ කල බවත් මේ වන විට ප්‍රශ්නයක් පැන නැගී ඇති බව පෙනෙන බවත් ප්‍රකාශ කරන ලදී. | | | |
| යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති -එච්.එම්.එස්.සුනිල් ශාන්ත මහතා | යාය 05 ගොවි සංවිධාන භාර කෘ.ප.නි.ස නිලධාරී පොහොර ලේඛනයට ගොවීන්ගෙන් අත්සන් කර ගැනීමේදී ගොවි සංවිධාන සදහා සංවර්ධන මුදල් ගෙවා ඇත්දැයි සලකා බලන බවත් ගෙවා නොමැති නම් පොහොර බිල් ලබා නොදෙන බවත් ප්‍රකාශ කරන ලදී. | | | |
| කිවුලේකඩ ගොවි සංවිධානයේ ගරු සභාපති -පී.ජී.නිහාල් රාජරත්න මහතා | පොහොර මුදල් එකතු කිරීමේදී ගොවි සංවිධාන නිර්දේශය සලකා බැලිය යුතු බවත් එසේ නොමැති නම් ගොවි සංවිධාන නිලධාරී කමින් තමන්ට ඉවත් වීමට සිදු වන බවත් ප්‍රාදේශීය නිලධාරීතුමා ව්‍යාපාර කමිටුවට පැමිණෙන්නේ නැතිනම් සිටින නිලධාරීන් ඒ සදහා මැදිහත් විය යුතු බවත් | | | |
| මරදන්කල්ල ගොවි සංවිධානයේ ගරු සභාපති -කේ.එම්.උදේනි බංඩාර ඉලංගසිංහ මහතා | යකල්ල ගොවි ජන සේවා නිලධාරීන් පොහොර ලබා දීමට පෙර ගොවීන්ට ඉල්ලුම් පත්‍රයක් ලබා දෙන බවත් ,යාය නියෝජිත තම යුතුකම ඉටු කරමින් අවශ්‍ය දේ ගොවින් ලවා කර ගැනීමට කටයුතු කල යුතු බවත් | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ගරු සභාපති -එම්.වයි.ජී.සෝමපාල මහතා | ඇලවේලි සුද්ද කිරීමට දින 2 ක් යොදා ගැනීම සුදුසු බව | එය ප්‍රායෝගික නොවන බව | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු | |

ගොවි සංවිධාන අදහස් ලබා ගනිමින් කන්න රැස්වීමේදී දුන් අවසරය මත එදින ව්‍යාපාර කමිටුවේදී කන්න තීරණ පහත පරිදි සංශෝධනය විය.

| 2019/12/03 වන දින ව්‍යාපාර කමිටුවේදී ගන්නා ලද කන්න තීරණ | | |
|---|---|---|
| 01. | වගා කළ යුතු බිම් ප්‍රමාණය | සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය අක්කර 10400 |
| 02. | කන්නය සදහා සුදුසු බෝගය හා වයස | වී-මාස -03/ අතිරේක බෝග |
| 03. | ගොවීන් විසින් ඇලවේලි සුද්ධ කිරීමේ අවසන් දිනය | 2019/12/08 ට පෙර |
| 04. | ගොවීන් විසින් සුද්ධ නොකරන ලද ඇලවේලි ගො.ස. මඟින් සුද්ධ කිරීමේ අවසන් දිනය | 2019/12/11 ට පෙර |
| 05. | ට්‍රැක්ටර් යායෙන් ඉවත් කිරීමේ අවසන් දිනය | 2019/12/20 |
| 06. | වපුරා හෝ පැල සිටුවා අවසන් කළ යුතු දිනය | 2019/12/20 ට පෙර |
| 07. | මුර ජලය නිකුත් කිරීමේ ආරම්භක දිනය | 2019/12/23 |
| 08. | මුර ජලය නිකුත් කිරීමේ අවසන් දිනය | 2020/03/06 |
| 09. | වගා රක්ෂණය කර අවසන් කළ යුතු දිනය | 2019/12/20 |
| 10 | වගා හානි දැනුම් දීමේ අවසන් කළ යුතු දිනය | 2020/03/06 |
| 11 | අස්වනු නෙළීම අවසන් කළ යුතු දිනය | 2020/03/30 |
| 13. | ඇළවේලි සුද්ධ නොකිරීමේ දඩය | බඹයට රු.200 |
| 14. | සංවර්ධන මුදල් අක්කරයට | රු.300 |
| 15. | වාරිමාර්ග නිර්මිත හානි වලට අය කරනු ලබන දඩය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව තක්සේරුව මත |

ඉහත සදහන් කන්න තීරණ ක්‍රියාත්මක කිරීම සුදුසු බවට පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ සභාපති කරුණාරත්න මහතා යෝජනා කල අතර ස්ථිර කරන ලද්දේ ඩී 12-13 ගොවි සංවිධානයේ ගරු සභාපති රණවක මහතා විසිනි.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීමට ගත වන කාල |
|---|---|---|---|---|
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | සියලූම ගොවි සංවිධාන වල 2019/12/04 දින ශබ්ද විකාශන යන්ත්‍ර යොදා කන්න තීරණ පිළිබද ගොවීන් දැනුවත් කරන ලෙස | | | |
| රණමයුර උල්පත්ගම ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික - | ඇලවේලි සුද්ද නොකරන ගොවීන්ගේ කුඹුරු බට කොන්ක්‍රිට් කල යුතු බවත් යම් හෙයකින් කැඩීම සිදු කරන්නේ නම් | | | |

| | | | | |
|---|---|---|---|---|
| ජේ.කරුණාරත්න මහතා | නිලධාරීන් මැදිහත් විය යුතු බවත් | | | |
| කිවුලේකඩ ගොවි සංවිධානයේ ගරු ලේකම් - පී.ජී.විමලදාස මහතා | Fc 08 ඇල ගැඹුරු කර ඇති බවත් එය සමාන්තර ඇලක් බවත් කෘෂි පාරවල් සංවර්ධනයේ දී නිර්මිතයක් සම්පූර්ණයෙන් හානි වී ඇති බවත් 14 A ඇලෙහි උම වී ඇති බවත් ,කුඹුරු බට අවශ්‍ය බවත් ,ප්‍රධාන ඇලෙහි දොරටු දැමිය යුතු බවත් ,මෙම සංවර්ධන කටයුතු කඩිනමින් සකස් කල යුතු බවත් | කිවුලේකඩ 14 ඇලෙහි සංවර්ධන කටයුතු දියවර නෑයෝ වැඩ සටහනින් වැඩිපුර කල නිසා ඇතැම් ගොවි සංවිධාන වල කටයුතු අතපසු වූ බවත් සම්පත් හිග තාවයක් පවතින බවත් තියන සම්පත් වලින් කටයුතු කල යුතු බවත් | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු | |
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | ඩී 11,12,13 ගොවීන්ට දිවුල්වැවෙන් ජලය අවශ්‍ය නැතිනම් තමා ඉදිරිපත් කල අදහස ඉල්ලා අස් කර ගන්නා බව | | | |
| අලුත්දිවුල්වැව ගොවි සංවිධානයේ ගරු සභාපති - එස්.බී.කරුණාතිලක මහතා | රක්ෂිත පිළිබද තමන් කථා කරද්දී දිවුල්වැවෙන් පහල ගොවි සංවිධාන වල සහය ඒ සදහා නොලැබුණු බව | | | |
| දුටුවැව ඩී 11 ගොවි සංවිධානයේ ගරු සභාපති -සුනිල් ධර්මසිංහ මහතා | හුරුළුවැව,කිවුලේකඩ,අලුත්දිවුල්වැව වැව් තුනේම රක්ෂිත පිලිබද කථා කලද නිලධාරීන්ගෙන් විසදුම් නොලැබුණු බවත් ඒ සදහා ගොවි සංවිධාන වලට දෝෂාරෝපණය නොකල යුතු බවත් ඒ සදහා ඒකාබද්ධ ගොවි සංවිධානය මැදිහත් විය යුතු බවත්,<br>එමෙන්ම දිවුල්වැව වාන් දාන විට ඩී | 10/15 දින ඇස්තමේන්තු අනුමත කල බවත් වර්ෂාව නිසා වැඩ ආරම්භ කිරීමට නොහැකි වූ බවත් අඩුපාඩු හැකි පමණ | ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු | |

| | | | | |
|---|---|---|---|---|
| | 11 ජලයෙන් යට වන බවත් ,<br>ඩී 11 ගොවි සංවිධානය තුල 2018 වසරේදී පීෂිප් ව්‍යාපෘතිය ආරම්භ කලද කෘෂි කර්ම දෙපාර්තමේන්තුවෙන් බිත්තර වී සුද්ද කිරීමේ යන්ත්‍රයක් ලබා දීම හැර වෙනත් කිසිදු කටයුත්තක් මෙතෙක් සිදු වී නොමැති බව | සම්පූර්ණ කිරීමට මැදිහත් වන බවත් | | |
| හුරුළුනිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ගරු ලේකම්-ඒ.ඩබ්.අබේසිංහ මහතා | ඩී 11ගොවි සංවිධානය සදහා දිවුල්වැවෙන් ජලය ලබා දීම සුදුසු බවත් ,හුදකලාවේ ප්‍රශ්න වලට විසදුම් සොයනවාට වඩා පොදුවේ විසදුම් සෙවීම උචිත බවත් පීසිප් ව්‍යාපෘතිය පිළිබද විශාල බලාපොරොත්තු තබා නොගත යුතු බවත් | පීෂිප් ව්‍යාපෘතිය යටතේ සංවිධාන සියල්ලෙහිම මූලික සමීක්ෂණ කර අවසන් බවත් ඉදිරි වසර වලදී ව්‍යාපෘතිය සදහා ප්‍රතිපාදන වැඩි කිරීමට ඉඩ ඇති බවත් | නේවාසික ව්‍යාපෘති කළමනාකරු | |
| පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති එච්.එම්.කරුණාරත්න මහතා | ගැමුණු ගොවි සංවිධානයේ fc 19,20,21 ඇලවල්වල යකඩ දොරවල් දිරා ඇති බවත් ඒ සදහා ගේට්ටු දැමිය යුතු බවත් fc 17,18,19 ඇලවල්වල රොන්මඩ ඉවත් කල යුතු බවත්,කුඹුරු බට 30 ක් අවශ්‍ය වී ඇති බවත් ,ඩී 1,ඩී 2 ඇලවල රෙගුලේටර් පාත් කිරීම සුදුසු බවත් | | | |
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | සෑම ගොවි සංවිධානයකම සංවර්ධනය කල යුතු බොහෝ දේ ඇති බවත් මේ පිලිබද සාකච්ඡා කර ගැනීමටත්,ජල ප්‍රශ්න විසදා ගැනීමටත් දේශපාලන අධිකාරියේ වග කිව යුතු නිලධාරීන් හමු වීමට යාමට කටයුත්තක් සැලසුම් කල යුතු බවත් | | | |

| | | | | |
|---|---|---|---|---|
| පඩිකාරමඩුව ගැමුණු ගොවි සංවිධානයේ ගරු සභාපති එච්.එම්.කරුණාරත්න මහතා | හුරුළුවැවෙහි කිරි ඉතිරීම සිදු වූ බවත්,ඉන් පසුව වර්ෂාව ලැබුණු බවත් ඒ සදහා සහභාගී වූවන්ට ස්තූතිය පුද කර සිටින බවත් | | | |
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති -උපාලි මහතා | මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම සදහා ගොවි සංවිධාන මට්ටමේ නියෝජනයක් සිදු නොවීම ගැටලු සහගත බවත් උදාර ගොවි සංවිධානයෙහි කමතක් ඉදි කිරීමට නියමිත ඉඩමෙහි ඉඩම් ප්‍රශ්නයක් ඇති බවත් ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී ව්‍යාපාර කමිටුවේ සාකච්ජා කල කරුණු පිළිබද සියලු නිලධාරීන් දැනුවත් කිරීම සිදු කල යුතු බවත් | | | |

<u>නේවාසික ව්‍යාපෘති කළමනාකරු- ඊ.එම්.ඩබ්.කේ.ඒකනායක මහතා</u>

2020 වසර සදහා මෙතෙක් පිෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූ නව ගොවි සංවිධාන තුනක් තෝරා ගත යුතු බවත් ඒ සදහා ගොවි සංවිධාන වල යෝජනා ස්ථිරත්වයෙන් ප්‍රමුඛතාවය ලබා දිය යුතු ගොවි සංවිධාන **තුනක්** නම් කර දෙන ලෙසත් දැනුවත් කරන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීමට ගත ... කාලය |
|---|---|---|---|---|
| උදාර ගොවි සංවිධානයේ ගරු සභාපති - උපාලි මහතා | 2020 වසරේ පිෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා **යාය 05 ගොවි සංවිධානය** සුදුසු බවට යෝජනා කරන ලදී. | | | |
| දුටුවැව ඩී12- 13 පැරකුම් ගොවි සංවිධානයේ ගරු සභාපති - ආර්.ඒ.පී.කේ.රණවක මහතා | ඉහත සදහන් යෝජනාව ස්ථිර කරන ලදී. | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ | 2020 වසරේ පිෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා **ඩී 05 නිකවැව ගොවි සංවිධානය** | | | |

| | | | | |
|---|---|---|---|---|
| ගරු සභාපති - එම්.වයි.ජී.සෝම පාල මහතා | සුදුසු බවට යෝජනා කරන ලදී. | | | |
| නිකවැව ඩී 06 ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික - එන්.කේ.ජී. ජයතිලක මහතා | ඉහත සදහන් යෝජනාව ස්ථිර කරන ලදී. | | | |

2020 වසරේ පීෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සදහා ගැමුණු **ගොවි සංවිධානය නම් කරන ලෙස ගැමුණු ගොවි සංවිධානයේ සභාපති කරුණාරත්න මහතාද, ඒ සදහා සමගි ගොවි සංවිධානය තෝරා ගැනීම සිදු කරන ලෙස සමගි ගොවි සංවිධානයේ ලේකම් මහතා ඉල්ලීම් සිදු කල අතර** ගොවි සංවිධාන දෙකක් ඉල්ලීම් කිරීම නිසා කරුණු සලකා බැලීමෙන් පසු අවස්ථාව හිමි වූයේ සමගි ගොවි සංවිධානයටයි.

ඒ අනුව 2020 වසර සදහා පිෂිප් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිමට **යාය 05 ගොවි සංවිධානයද, ඩී 05 නිකවැව ගොවි සංවිධානයද, සමගි ගොවි සංවිධානය ව්‍යාපාර කමිටුවේ එකගතාවය අනුව තෝරා ගැනුණි.**

නේවාසික ව්‍යාපෘති කළමනාකාර මහතා විසින් ඵලදායි ප්‍රවර්ධන හා වාරිමාර්ග පද්ධති වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2020 ට අදාල ක්‍රියාත්මක සැලැස්ම කමිටුවට ඉදිරිපත් කල අතර එය ව්‍යාපාර කමිටුව අනුමත කරන ලදී.2020 පීෂිප් ව්‍යාපෘතියේ ක්‍රියාත්මක සැලැස්ම-

| ක්‍රියාකාරකම | සංඛ්‍යාව |
|---|---|
| ඒකාබද්ධ ක්‍රියාකාරි සැලැස්ම සැකසීම | 06 |
| ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ පුහුණුව | 01 |
| මුල්‍ය කළමණාකරණ පුහුණුව | 01 |
| නීතිමය බලතල පුහුණුව | 01 |
| ගොවිපල ජල කළමණාකරණ පුහුණුව | 01 |
| ගොවි අධ්‍යන චාරිකා | 02 |
| රක්ෂිත සීමා කණු | 600 |
| දැන්වීම් පුවරු සවි කිරීම | 36 |
| ගබඩා කාමරය | 01 |
| කසල බදුන් සවි කිරීම. | 36 |

කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර,ගොවි ජන සේවා මධ්‍යස්ථානය-යකල්ල-එස්.ඩී.තෙරේසා සමරකෝන් මිය

යකල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයට අයත් 192,193 කොට්ඨාශ සදහා මඩ පොහොර ලබා දුන් බවත්, අක්කර 220 ක මුදල් එකතු කල බවත්,යකල්ල ගොවි ජන සේවා මධ්‍යස්ථානයට අයත් කෘ.ප.නි.ස මහතුන් එකතු වී ගොවීන්ට පොහොර ඉල්ලුම් පත්‍රයක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

කෘෂිකර්ම සංවර්ධන නිලධාරී,ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, ගලෙන්බිදුණුවැව-ඩබ්ලිව්.එම්.පී.කේ. කුමාර මහතා

පසු අස්වනු තාක්ෂණයේදී ජම්බෝ වර්ගයේ හා විශාල වර්ගයේ ඇසුරුම් උපකරණ ලබා දෙන බවත් ඒ සදහා ඉල්ලුම් පත්‍රයක් ඇති බවත්, අවශ්‍ය අය එම ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කර ලබා දෙන ලෙසත් බීජ අවශ්‍යතාවයන්,රෝපණ ද්‍රව්‍ය අවශ්‍යතාවයන්,අතිරේක බෝග අවශ්‍යතාවයන්,පලතුරු පැල අවශ්‍යතාවයන් ඉල්ලීම් කරන ලෙසත් දැනුවත් කරන ලදී.

## ප්ලෙන්ටි ෆුඩ් සමාගම - විධායක අධ්‍යක්ෂක -ප්‍රීතිවිරාජ් මහතා

ප්ලෙන්ටි ෆුඩ් සමාගම අක්කර 2000 ක බීජ සෝයා වැඩ සටහන කිරීමට නියමිත බවත් ඒ සදහා අත්තිකාරම් මුදලක් ලබා දීම මෙන්ම සෝයා බීජ නිෂ්පාදනයට අවශ්‍ය වෙනත් පහසුකාරකයන් ලබා දිමට නියමිත බවත් හැකි අක්කර ප්‍රමාණයක් සෝයා වගාවට යොමු වන ලෙසත් දැනුම් දෙන ලදී.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම | ඉටු කිරීමට ගත වූ කාලය |
|---|---|---|---|---|
| යාය 05 ගොවි සංවිධානයේ ගරු සභාපති - එච්.එම්.එස්.සුනිල් ශාන්ත මහතා | බීජ සෝයා සදහා කෘෂි කර්ම දෙපාර්තමෙන්තුවේ මෙන් මිලක් ලබා දෙන්නේ නම් සුදුසු බව | අවම ගිවිසුම් මිල රු. 110/= වන බවත් වෙලෙද පොලේ පවතින මිලට සෝයා මිලදී ගන්නා බවත් | ප්ලෙන්ටි ෆුඩ් නියෝජිත මහතා | |

මෙම ව්‍යාපාර කමිටුවේදී සංශෝධනය කරන ලද කන්න තීරණ පිළිබද ගොවියා දැනුවත් කරන ලෙස ගොවි නායකයින්ට දැනුම් දෙමින් නේවාසික ව්‍යාපෘති කළමනාකාර ඒකනායක මහතා විසින් පැමිණි සියළු දෙනාට ස්තූති කරමින් ප.ව 1.00 ට පමණ ව්‍යාපාර කළමනාකරණ කමිටුවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.



ඊ.එම්.ඩබ්.කේ. ඒකනායක,
නේවාසික ව්‍යාපෘති කළමනාකරු,
හුරුළුවැව ව්‍යාපාරය.

පිටපත් -

1. අධ්‍යක්ෂ, වාරිකළමනාකරණ අංශය/කොළඹ -
   කා.දැ.ගැ.පි
2. දිස්ත්‍රික් ලේකම්, අ/පුර -
   කා.දැ.ගැ.පි
3. වාරිමාර්ග අධ්‍යක්ෂ, අ/පුර -
   කා.දැ.ගැ.පි
4. ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්, , අ/පුර
   - කා.දැ.ගැ.පි
5. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(අන්තර් පලාත්), අ/පුර
   - කා.දැ.ගැ.පි
6. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අ/පුර -
   කා.දැ.ගැ.පි
7. වැඩ සටහන් අධ්‍යක්ෂ,(පීෂීජ්)/කොළඹ -
   කා.දැ.ගැ.පි
8. නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ, (පීෂීජ්),වාරිමාර්ග දෙපාර්තමේන්තුව,කොළඹ
   -කා.දැ.ගැ.පි